1 පත්‍රය

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. පහත නාම පදවලින් ද්‍රව්‍ය නාමයක් නොවන්නේ,

I. පාන් II. අලියා III. පොහොර IV. කෝටුව

02. අක්ෂර වින්‍යාසය නිවැරදිව ලියා ඇති වචන පේළිය වන්නේ,

I. කාව්‍යා, කලු, කෘත්‍රිම, වළාකුළු

II. වෘශ්චික, ගෘහස්ත, දෘෂ්‍ය, නෘත්‍ය

III. ප්‍රදර්ශනය, ප්‍රථිපල, පක්ෂියා, සංග්‍රහය

IV. පෞරාණික, ශෛලමය, කාලගුණය, චේතය

03. නොගැළපෙන පදයක් ඇති පද පේළිය වන්නේ,

I. ගස = වෘක්ෂය, රුක, පුෂ්පය, දූම

II. පාසල = විදුහල, විද්‍යාලය, සිප්හල, ඉස්කෝලය

III. අහස = ගුවන, සියොත්මග, ගගන, පවන්මග

IV. අම්මා = මව, මාතෘ, මෑණිය, දිනිති

04. බොහෝ දුක් මහන්සියෙන් කළ වැඩක කිසිදු ප්‍රතිඵලයක් නොලැබුණු විට යෙදිය හැකි ප්‍රස්තාව පිරුළ වන්නේ,

I. නරියා මිදි තිත්තයි කිව්ව වගේ

II. කට නිසා ඉබ්බා නැහුනා වගේ

III. ගඟට ඉනි කැපුවා වගේ

IV. පාළු ගෙදර වළං බිඳිනවා වගේ

05. මඩොල් දූව ළමා නව කතාව රචනා කර ඇත්තේ,

I. පියසේන කහඳගමගේ මහතා

II. මාර්ටින් වික්‍රමසිංහ මහතා

III. කරුණාරත්න අබේසේකර මහතා

IV. සිබිල් වෙත්තසිංහ මහත්මිය

06. පහත වචනවල රවුම් කර ඇති අකුරුවල පිල්ලම පිළිවෙළින් දක්වා ඇත්තේ,

කඩම(ණ්)ඩිය හප(නා) (මැ)දින් ති(දෙ)නා

I. ඇලපිල්ල, හල් කිරීම, කොම්බුව, ඇදපිල්ල

II. කොම්බුව, ඇදපිල්ල, ඇලපිල්ල, කොඩිය

III. කොම්බුව, හල් කිරීම, ඇලපිල්ල, ඇදපිල්ල

IV. කොඩිය, ඇලපිල්ල, ඇදපිල්ල, කොම්බුව

07. ජපන් පෙළපොතට ගිය ශ්‍රී ලාංකික ක්‍රීඩකයා වන්නේ,

I. රණතුංග කරුණානන්ද මහතා

II. ජොහාන් පීරිස් මහතා

III. අර්ජුන රණතුංග මහතා

IV. සුසන්තිකා ජයසිංහ මහත්මිය

08. එවරස්ට් කන්ද තරණය කළ දෙවන ශ්‍රී ලාංකිකයා වන්නේ,

I. ජයන්ති කුරුඋතුම්පාල මහත්මිය

II. ජොහාන් පීරිස් මහතා

III. ශ්‍රියානි කුලවංශ මහත්මිය

IV. සුසන්තිකා ජයසිංහ මහත්මිය

09. "අක්කේ ටිකක් ඉන්නකෝ" ගීතයේ පද රචනා කර ඇත්තේ,

I. පී.බී. අල්විස් පෙරේරා මහතා

II. මර්වින් සේනාරත්න මහතා

III. කරුණාරත්න අබේසේකර මහතා

IV. සෝමරත්න දිසානායක මහතා

10. උත්තම පුරුෂ ඒක වචන උක්ත පදයක් ඇති අතීත කාල වාක්‍යයක් වන්නේ,

I. අපි සරුංගල් යවමු.

II. මම අකුරු ලියමි.

III. මම පන්සල් ගියෙමි.

IV. අපි බත් කෑවෙමු.

11. සූර්ය නමස්කාරයේ අවස්ථා ගණන වනුයේ,

I. 12 II. 13 III. 15 IV. 10

www.lkedu.lk

12. උරණ නොවෙමු කිසි ලෙසේ
නිතර වෙසෙමු සිත් තොසේ
මිදුලේ ඇති මල් ගසේ
පිපෙන සොඳුරු මල් ලෙසේ කවියෙන් කියවෙන්නේ,

I. ආක්‍රමණශීලී චර්යා ගැන ය.
II. යටහත් චර්යා ගැන ය.
III. සහනශීලී චර්යා ගැන ය.
IV. ආචාරශීලී චර්යා ගැන ය.

13. ශ්‍රී ලංකාවේ ලී කැටයම්වලට ප්‍රසිද්ධ ස්ථානය වන්නේ,

I. ඇම්බැක්කේ දේවාලය යි.
II. ගඩලාදෙණිය විහාරය යි.
III. මහනුවර දළදා මාළිගය යි.
IV. රිදී විහාරය යි.

14. මහනුවර රාජධානියේ රජකෙනෙකු ලෙස අභිෂේක ලබා කස පහර 100 ක් කෑමෙන් මිය යාමට ලක් වූ ජාතික වීරවරයා වන්නේ,

I. මොණරවිල කැප්පෙටිපොළ දිසාව
II. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා
III. අනගාරික ධර්මපාලතුමා
IV. ගොංගාලේගොඩ බණ්ඩා

15. සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ ප්‍රථම පියවර වන්නේ,

I. මානසික ලිහිල් බව
II. අධිෂ්ඨානය
III. ප්‍රාර්ථනය
IV. ශාරීරික ලිහිල් බව

16. වාහනයක ආදායම් බලපත්‍රයක් ලබා ගැනීමට අප විසින් යා යුත්තේ,

I. ප්‍රාදේශීය සභාවට යි.
II. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යි.
III. කම්කරු දෙපාර්තමේන්තුවට යි.
IV. ග්‍රාමසේවා නිලධාරී වෙතට යි.

17. ගුවනේ පා වී ගසකින් ගසකට මාරු වීමේ හැකියාව ඇති සතා වන්නේ,

I. වඳුරා II. දඬු ලේනා III. වවුලා IV. හම්බාවා

www.lkedu.lk

18. පැළෑටියක් වැඩීමට අවශ්‍ය දෙයක් නොවන්නේ,

I. පස II. ජලය III. රසායනික පොහොර IV. වාතය

19. එක් කාලයකට පමණක් මල් පිපෙන ශාකයක් නොවන්නේ,

I. බක් මී මල් II. වෙසක් මල් III. මැයි මල් IV. පුවක් මල්

20. කඩොලාන ශාක දැකිය හැක්කේ,

I. මුහුදු වෙරළ ආශ්‍රිතව

II. වියළි කලාපයේ වැව් ආශ්‍රිතව

III. කඳුකර ප්‍රදේශවල දිය ඇළි ආශ්‍රිතව

IV. කඳු මුදුන්වල

21. තොරණක කහ පාට බල්බ මිනිත්තු 5 කට වරක් ද, රතු පාට බල්බ මිනිත්තු 15 කට වරක් ද, නිල් පාට බල්බ මිනිත්තු 10 කට වරක් ද දැල්වේ. බල්බ තුනම පෙ.ව. 7.00 දැල් වේ නම්, නැවත බල්බ තුනම එකවර දැල්වෙන්නේ කීයටද?

I. පෙ.ව. 7.30 II. පෙ.ව. 7.15 III. පෙ.ව. 7.35 IV. පෙ.ව. 8.00

22. 2019 ජූලි 27 අඟහරුවාදා දවසක් නම් එම වසරේ නොවැම්බර් කවදා දවසක් ද?

I. බදාදා II. අඟහරුවාදා III. ඉරිදා IV. බ්‍රහස්පතින්දා

23. ටොෆි 262 ක් 5 බැඟින් උරවලට දැම්මේ නම් ඉතිරි ටොෆි ගණන කීයද?

I. 1 II. 2 III. 3 IV. 4

24. දුම්රිය නැවතුම්පළකට දිනක දී ඇතුළු වූ මගීන් සංඛ්‍යාව 4497 ක් වන අතර පිට වූ මගීන් සංඛ්‍යාව 2359 කි. ඇතුළු වූ හා පිට වූ මගීන් සංඛ්‍යාව අතර වෙනස කීයද?

I. 2138 II. 2147 III. 2137 IV. 1138

25. පෙට්ටියකට විස්කෝතු පැකැට්ටු 10 ක් දැමිය හැකිය. එහි දැනට ඇත්තේ 6 කි. තව විස්කෝතු පැකැට්ටු කීයක් එයට දැමිය හැකිද?

I. 5 II. 4 III. 6 IV. 8

26. II IV VI ..... X නම් හිස්තැනට ආ යුත්තේ,

I. VIII II. VII III. IX IV. X

www.ikedu.lk

27. ඩිජිටල් වේලාවෙන් 00:00 යනු,

I. මධ්‍යාහන 12.00

II. පෙරවරු 1.00

III. පස්වරු 8.00


IV. මධ්‍යම රාත්‍රී 12.00

28. මඟියෙකු 25km 500m දුරකින් 18km 500m දුරක් දුම්රියෙන් ද ඉතිරි දුර බසයකින් ද ගමන් කරන ලදී. බසයෙන් ගිය දුර ප්‍රමාණය කොපමණද?

I. 7km II. 3km III. 2km IV. 5km

29. 2762 සංඛ්‍යාවේ 6 හි අගය වන්නේ,

I. 10 II. 60 III. 600 IV. 100

30. 

මෙම රූපයේ පාට කර ඇති කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියූ විට,

I. 0.7 II. 0.3 III. 0.5 IV. 10.3

31. ජාතික ගීය ගායනා කරන විට අප සිටිය යුත්තේ,

I. සීරුවෙන් ය.

II. පහසුවෙන් ය.

III. ඇවිදිමින් ය.

IV. සිත් සේ ය.

32. පහත දැක්වෙන ද්‍රව්‍ය අතරින් දිරන ද්‍රව්‍යයක් නොවන දෙය කුමක්ද?

I. වයර් II. ශාක පත්‍ර III. කඩදාසි IV. දැව

33. පා තලයක් පිහිටි සතකු වන්නේ,

I. ගෙම්බා II. ගොළුබෙල්ලා III. ඉබ්බා IV. කැස්බෑවා

34. "උදේට <u>පෙරදිගින්</u> හිරු පායා එන විට මල් <u>විකසිත</u> වේ" මෙම වාක්‍යයේ ඉරි ඇඳි පද වෙනුවට යෙදිය හැකි විරුද්ධ පද දෙක පිළිවෙළින්,

I. පර වේ, අපරදිගින්

II. නැගෙනහිරින්, මුකුලිත

III. අපරදිගින්, මුකුලිත

IV. මුකුලිත, බටහිරින්

www.ikedu.lk

35. හාවාගේ ගමන් විලාසය අනුව සැකසී ඇති වන්නම වනුයේ,

I. නයි අඩි වන්නම

II. මයුරා වන්නම

III. තුරඟා වන්නම

IV. මුසලඩි වන්නම

36. ශ්‍රී ලංකාවේ ගල් අඟුරු විදුලි බලාගාරයක් වන්නේ,

I. නොරොච්චෝලේ විදුලි බලාගාරය

II. කැලණිතිස්ස විදුලි බලාගාරය

III. ලක්ෂපාන විදුලි බලාගාරය

IV. වික්ටෝරියා විදුලි බලාගාරය

37. ශරීරයේ බර අඩුවීම සිදුවන්නේ,

I. ප්‍රෝටීන් අඩු වීමෙන්

II. විටමින් අඩු වීමෙන්

III. මේදය අඩු වීමෙන්

IV. කාබෝහයිඩ්‍රේට් අඩු වීමෙන්

38. සුළං මඟින් ව්‍යාප්ත වන බීජ වර්ග පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

I. වරා, කූඩලු, අඹ, වී

II. තුත්තිරි, ඇපල, පුවක්, පෙනෙල

III. පුළුන්, රබර්, මහෝගනී, නාගදරණ

IV. වරා, අගුණා, පුළුන්, මොණරකුඩුම්බිය

39. කළුපොල් මාළුව සාදා ගැනීමට ගන්නා බීජ වර්ගයක් වන්නේ,

I. කොස් ඇට

II. පොල්

III. කොස් දෙල් ඇට

IV. ගම්මිරිස්

40. ශ්‍රී ලංකාවේ ඒක දේශික සතෙකු නොවන්නේ,

I. වළි කුකුළා II. බුලත් හපයා III. කපුටා IV. දිය නයා

www.lkedu.lk